# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1872/35 - 2014 ජූලි මස 25 වැනි සිකුරාදා - 2014.07.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වන ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි. මෙම නියමය 2014 ජූලි මස 26 වැනි දින සිට ආරම්භ වන මාස 03 ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2014.05.21 දිනැති අංක 1863/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් මැ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, මුං ඇට, කව්පි, කුරක්කන් (සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 07.13 සහ 10.08) සහ 2014.05.23 දිනැති අංක 1863/28 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පරිප්පු (සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 07.13) සඳහා ප්‍රකාශිත අදාළ නියමයන් 2014 ජූලි මස 26 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2014 ජූලි මස 25 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතය* | *විස්තරය* | |
| 1. | 07.13 | 0713.10.10 | සම්පූර්ණ - මැ වර්ගයේ ඇට (පීසම් සැටයිවම්) | කි.ග්‍රෑමයකට රු. 15.00 |
| | | 0713.10.20 | පියලි කළ - මැ වර්ගයේ ඇට (පීසම් සැටයිවම්) | කි.ග්‍රෑමයකට රු. 18.00 |

උපලේඛනය (සම්බන්ධිතයි)

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 2. | | 0713.20.10 | සම්පූර්ණ - කොණ්ඩ කඩල (ගාර්බන්සෝස්) | කි.ග්‍රෑමයකට රු. 7.00 |
| | | 0713.20.20 | පියලි කළ - කොණ්ඩ කඩල (ගාර්බන්සෝස්) - | කි.ග්‍රෑමයකට රු. 10.00 |
| 3. | | 0713.31.10 | මුං ඇට | කි.ග්‍රෑමයකට රු. 70.00 |
| 4. | | 0713.35 | කව්පි | කි.ග්‍රෑමයකට රු. 70.00 |
| 5. | | 0713.40.11 | සම්පූර්ණ - මයිසූර් පරිප්පු (රතු පරිප්පු) | කි.ග්‍රෑමයකට රු. 2.00 |
| | | 0713.40.12 | පියලි කළ - මයිසූර් පරිප්පු (රතු පරිප්පු) | කි.ග්‍රෑමයකට රු. 5.00 |
| | | 0713.40.21 | සම්පූර්ණ - කහ පරිප්පු | කි.ග්‍රෑමයකට රු. 2.00 |
| | | 0713.40.22 | පියලි කළ - කහ පරිප්පු | කි.ග්‍රෑමයකට රු. 5.00 |
| 6. | 10.05 | 1005.90 | බඩ ඉරිඟු - අනෙකුත් | කි.ග්‍රෑමයකට 10% |
| 7. | 10.07 | 1007.10 | ඉදල් ඉරිඟු ඇට (සෝගම්) - බීජ | කි.ග්‍රෑමයකට 10% |
| | | 1007.90 | ඉදල් ඉරිඟු ඇට (සෝගම්) - අනෙකුත් | කි.ග්‍රෑමයකට 10% |
| 8. | 10.08 | 1008.21.10 | බීජ - කුරක්කන් (ඉලියුසිනේ කොරකානා විශේෂ) | කි.ග්‍රෑමයකට රු. 70.00 |
| | | 1008.21.90 | බීජ - අනෙකුත් - (මිලට්) | කි.ග්‍රෑමයකට රු. 70.00 |
| | | 1008.29.10 | අනෙකුත් - කුරක්කන් (ඉලියුසිනේ කොරකානා විශේෂ) | කි.ග්‍රෑමයකට රු. 70.00 |
| | | 1008.29.90 | අනෙකුත් - (මිලට්) | කි.ග්‍රෑමයකට රු. 70.00 |

08-1009

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.